දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

சுதேச வைத்திய அமைச்சு

Ministry of Indigenous Medicine

# ආයුර්වේද වෛද්‍ය සභාව

## ஆயுர்வேத வைத்திய சபை

## Ayurveda Medical Council

## වාර්ෂික වාර්තාව - 2012

## வருடாந்த அறிக்கை - 2012

## Annual Report - 2012

# ආයුර්වේද වෛද්‍ය සභාව

## වාර්ෂික වාර්තාව - 2012



**පරණ කොට්ටාව පාර,**

**නාවින්න,**

**මහරගම**

# පටුන


| | |
|---|---|
| ආයුර්වේද වෛද්‍ය සභාවේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථය | 2 |
| අභිමතාර්ථ, ආයුර්වේද වෛද්‍ය සභාවේ හැඳින්වීම හා කාර්යභාරය | 3 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය | 4 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජිකයින් - 2012 | 5 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය | |
| මූල්‍ය සම්පාදනය | 6 - 7 |
| ප්‍රතිපත්ති සම්පාදනය හා අතිරේක සුදුසුකම් | 8 - 10 |
| විමර්ශණ හා විශේෂ වෛද්‍ය මණ්ඩල | 11 |
| ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම හා භෛෂජ්‍යකවරුන් ලියාපදිංචි කිරීම, ව්‍යවස්ථා සම්පාදනය, හෙළවෙද රුවනාර වැඩ සටහන | 12 - 20 |
| ආයුර්වේද වෛද්‍ය සභා කාර්යමණ්ඩලය හා නිල වෙබ් අඩවිය | 21 - 23 |
| 2012 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මගින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණවලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් පියවර | 24 - 25 |
| 2012 ආදායම් වියදම් වාර්තාව | 26 |
| 2012 ශේෂ පත්‍රය | 27 |
| 2012 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 28 |
| 2012 විගණකාධිපති වාර්තාව | 29 - 36 |
| 2012 විගණකාධිපති වාර්තාව සඳහා යොමු කළ පිළිතුරු වාර්තාව | 37 - 43 |
| සංස්ථාපිත තොරතුරු | 44 |
| ස්තුතිය | 45 |

## ආයුර්වේද වෛද්‍ය සභාවේ දැක්ම, මෙහෙවර, පරමාර්ථය

**දැක්ම**

**වෘත්තිය ගුණාත්මකභාවය හා**
**අභිමානය සුරක්ෂිත කරමින්**
**ශ්‍රී ලංකා ආයුර්වේද ක්ෂේත්‍රයේ උත්තරීතර**
**ආයතනය බවට පත්වීම.**

**මෙහෙවර**

**වෘත්තිය ආචාරධර්ම වලට අනුගත වූ උපරිම**
**මහජන සේවාවක් සළසමින්**
**ආයුර්වේද ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනය**
**සඳහා අවශ්‍ය නෛතික පදනම සුරක්ෂිත කිරීම.**

**පරමාර්ථය**

**1961 අංක 31 දරන ආයුර්වේද පනතෙහි**
**විධිවිධාන වලට අනුකූලව ආයුර්වේද ක්ෂේත්‍රයේ**
**ගුණාත්මක සංවර්ධනය සංස්ථාපනය කිරීමට අවශ්‍ය**
**දැනුම, කුසලතාවය හා පළපුරුද්ද සහිත**
**වෘත්තිකයින් වෙත**
**නෛතික අධිකාරිත්වය පිරිනැමීම**
**සහ වෘත්තියේ ගරුත්වය සහ ගුණාත්මකභාවය**
**සුරක්ෂිත කිරීම.**

අභිමතාර්ථ ඃ-

1. 1961 අංක 31 දරන ආයුර්වේද පනතින් සභාවට පවරා ඇති බලතල බලාත්මක කිරීම.
2. ආයුර්වේද ක්ෂේත්‍රයේ වෘත්තිමය නිපුණත්වය නගාලීමට ප්‍රමිති / නිර්ණායක තීරණය කිරීම හා පවත්වාගෙන යාම.
3. ආයුර්වේද වෘත්තිකයන්ගේ චර්යාව විධිමත් ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය ආචාරධර්ම හා ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම.
4. ආයුර්වේද ක්ෂේත්‍රයේ වෘත්තිය චර්යාවන් නිර්ණය කිරීම හා පාලනය කිරීම.
5. ආයුර්වේද වෛද්‍ය සභාවේ සම්පත් හා පහසුකම් යාවත්කාලීන කිරීම මගින් එහි කාර්ය සාධනය වැඩි දියුණු කිරීම.

## 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ස්ථාපිත ආයුර්වේද වෛද්‍ය සභාවේ හැඳින්වීම හා කාර්යභාරය

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශය අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. 1935 අංක 46 දරන ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා පනත මගින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරන ස්වදේශිය වෛද්‍ය ආඥා පනතේ ( 1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත ) විධිවිධාන යටතේ යළිත් ස්ථාපනය කරනු ලැබීය. දනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යභාරය පහත සඳහන් පරිදි දක්විය හැකිය.

(අ). ආයුර්වේදය උගන්වන යම් ආයතනයක් මේ පනතේ කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කළ යුතුද යන්න ඇමතිවරයාට නිර්දේශ කිරීම.

(ආ). ආයුර්වේද වෛද්‍යවරුන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඇ). ආයුර්වේද ඖෂධ සංයෝජකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඈ). ආයුර්වේද සාත්තු සේවකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඉ). එසේ ලියාපදිංචි කිරීම් අවලංගු කිරීම හෝ අත්හිටුවීම, හා

(ඊ). 1. ආයුර්වේද වෛද්‍යවරයන්, ආයුර්වේද ඖෂධ සංයෝජකයන් හා ආයුර්වේද සාත්තු සේවකයන්ගේ වෘත්තිය හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා,

2. මේ වගන්තියේ (ආ) සිට (ඉ) දක්වා ඡේදවල සඳහන් කරුණු වලින් යමක් සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීමයි.



# ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය

| | සාමාජික සංඛ්‍යාව |
|---|---|
| ආයුර්වේද වෛද්‍ය සභාව | 17 |
| සභාපති | 01 |
| ලේඛකාධිකාරී | 01 |
| ප්‍රධාන කළමනාකරණ සහකාර | 01 |
| කළමනාකරණ සහකාර | 08 |
| කාර්යාල කම්කරු | 02 |



2012 වර්ෂයේ 17 වන වෛද්‍ය සභාවේ සභා සාමාජිකයින්

| | | |
|---|---|---|
| 1. | ආයුර්වේද කොමසාරිස්, පී.එස්.කේ.ආර්.වීරකෝන් මයා | සභාපති |
| 2. | වෛද්‍ය ආර්.ඒ.ජයසිංහ මහතා -<br>අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යාආයතනය ( 2012.04.03 දක්වා ) | සාමාජික |
| 3. | සුනිමල් සේනාරත්න මයා<br>අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යාආයතනය ( 2012.05.11 සිට ) | සාමාජික |
| 4. | මහාචාර්ය, ජනිතා ඒ.ලියනගේ මිය<br>අධ්‍යක්ෂ, ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යාආයතනය ( 2012.10.23 සිට ) | සාමාජික |
| 5. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය ඩී.පී.ඒ.දිසානායක මයා | සාමාජික |
| 6. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය ටී.ඩී.එන්.කරුණාරත්න මයා | සාමාජික |
| 7. | වෛද්‍ය එස්.එච්.එම්.සේනබණ්ඩා මහතා | සාමාජික |
| 8. | ඩී.ජේ.යූ.පුරසිංහ මයා | උප සභාපති |
| 9. | එම්.එම්.ඒ.දේව් සිරිවර්ධන මයා | සාමාජික |
| 10. | වෛද්‍ය ඊ.එම්.පී.බී.ඒකනායක මයා | සාමාජික |
| 11. | වෛද්‍ය එම්.එම්.ඒ.කේ.අමරසිංහ මයා | සාමාජික |
| 12. | වෛද්‍ය සුනිල් ශාන්ත විජේතුංග මයා | සාමාජික |
| 13. | වෛද්‍ය එම්.සෙයිනුදීන් මයා | සාමාජික |
| 14. | වෛද්‍ය එම්.එම්.කේ.මාලිංගාව මයා | සාමාජික |
| 15. | එස්.ඒ.පී.සූරියප්පෙරුම මයා ( 2012.09.17 දක්වා ) | සාමාජික |
| 16. | භාණ්ඩාගාර නිරීක්ෂක, වසන්තා සමරවීර මිය ( 2012.06.11 දක්වා )<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | සාමාජික |
| 17. | භාණ්ඩාගාර නිරීක්ෂක, එම්.ආර්.ආර්.අබේවික්‍රම මිය ( 2012.07.23 සිට )<br>අධ්‍යක්ෂක, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | සාමාජික |
| 18. | වෛද්‍ය බැසිල් රංජිත් ප්‍රනාන්දු මයා | ලේඛකාධිකාරී |

මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභා රැස්වීම් 11 ක් පවත්වා ඇත.



## ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය - 2012

### 01. මූල්‍ය සම්පාදනය

2012 වර්ෂය වෙනුවෙන් ආයුර්වේද වෛද්‍ය සභාව වෙත රුපියල් හතලිස් හත් ලක්ෂයක ( 4,700,000/- ) මුදලක් රජයේ ප්‍රතිපාදන වශයෙන් ලබා දී ඇත.

2012 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාව විවිධ ක්ෂේත්‍රයන් මගින් ලැබූ ආදායම රු.2,361,369/- ක් වූ අතර වියදම රු.7,158,189/- ක් විය. 2012 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් ආදායම් හා වියදම් ගිණුමෙන් ද 2012.12.31 දිනට සභාවේ මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාවක් ශේෂ පත්‍රයෙන් ද ඉදිරිපත් කර ඇත. මීට අමතරව 2012 වර්ෂය තුළ මුදල් ගලා ඒම හා ගලා යාම පිළිබඳ වාර්තාවක් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය මගින් ඉදිරිපත් කර ඇත.

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වාර්ෂික ආදායම් හා වියදම් පිළිබඳ විස්තරයක් පහත වගු අංක 1.1 මගින් දක්වා ඇත.

වගු අංක 1.1

වාර්ෂික ආදායම, වියදම හා රජයේ ප්‍රතිපාදන

| අයිතමය | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| මුළු ආදායම | **7,061,369** | **5,800,665** | **8,205,626** | **5,969,278** | **7,036,291** |
| වියදම | **7,158,189** | **7,154,998** | **7,223,011** | **7,284,751** | **6,188,913** |
| අතිරික්තය / ( ඌණතාවය ) | **(96,820)** | **(1,354,333)** | **982,615** | **(1,315,473)** | **847,378** |
| රජයේ ප්‍රතිපාදන (1)** | **4,700,000** | **3,900,000** | **6,000,000** | **3,700,000** | **5,000,000** |
| මුළු ආදායමෙන් රජයේ ප්‍රතිපාදන % ලෙස | **67%** | **67%** | **73%** | **62%** | **71%** |

(1)** මුළු ආදායම සඳහා රජයේ ප්‍රතිපාදන ප්‍රමාණය ද ඇතුළත්ව ඇත.

රජයේ ප්‍රතිපාදන වශයෙන් 2008 වර්ෂයේ ලබා දුන් රු.5,000,000/- ක මුදල රු.6,000,000/- දක්වා වැඩි කර ගැනීමට 2010 වර්ෂයේ දී හැකි වී ඇත. එය 2012 වර්ෂයේ දී රු.4,700,000/- ලෙස පහත වැටී ඇත. රජයේ ප්‍රතිපාදන ප්‍රමාණය මුළු ආදායම ප්‍රතිශතයක් ලෙස සැළකූ විට 2008 වර්ෂයේ **71%** ක් ද 2009 වර්ෂයේ **62%** ක් ද 2010 වර්ෂයේ **73%** ක් ද 2011 වර්ෂයේ **67%** ක් හා 2012 වර්ෂයේ **67%** ක් වේ.

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රජයේ ප්‍රතිපාදන හා වාර්ෂික වියදම් පිළිබඳ විස්තරයක් පහත වගු අංක 1.2 මගින් දක්වා ඇත.

වගු අංක 1.2

ආයුර්වේද වෛද්‍ය සභාවේ රජයේ ප්‍රතිපාදන හා වාර්ෂික වියදම

| අයිතමය | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| රජයේ ප්‍රතිපාදන | **4,700,000** | **3,900,000** | **6,000,000** | **3,700,000** | **5,000,000** |
| වියදම | **7,158,189** | **7,154,998** | **7,223,011** | **7,284,751** | **6,188,913** |
| රජයේ ප්‍රතිපාදන වලට වඩා වැඩි වූ වියදම | **2,458,189** | **3,254,998** | **1,223,011** | **3,584,751** | **1,188,913** |
| රජයේ ප්‍රතිපාදන වියදමේ % ලෙස | **66%** | **54%** | **83%** | **50.7%** | **80.7%** |

ආයුර්වේද වෛද්‍ය සභාව සඳහා 2008 වර්ෂයේ රු.මිලයන 5.0 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් රජය ලබා දී ඇති අතර එය 2010 වර්ෂය වන විට රු.මිලයන 6.0 දක්වා වැඩිවී ඇතත් 2012 වර්ෂයේ රජයේ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලියන 4.7 දක්වා පහත වැටී ඇත. වර්ෂ 2008 සිට 2012 දක්වා කාල සීමාව තුළදී සත්‍ය වශයෙන්ම රජයේ ප්‍රතිපාදන අභිබවා සභාවේ වියදම් ඉහල ගොස් ඇතත්, එම වෙනස සභාවේ අනෙකුත් ආදායම් මාර්ග මගින් ආවරණය කර ගැනීමට සභාවට හැකි වි ඇත.

ප්‍රස්ථාර අංක 1.1



## 02. ප්‍රතිපත්ති සම්පාදනය

ආයුර්වේද වෛද්‍ය සභාව විසින් 2012 වර්ෂයේ පහත සඳහන් අනු කමිටු හා වැඩමුළු ක්‍රියාත්මක කරන ලදී. ඒවා නම්,

- ❖ විභාග පාලක මණ්ඩලය - ස්ථාවර අනු කමිටු
- ❖ දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව - ස්ථාවර අනු කමිටු

### ❖ විභාග පාලක මණ්ඩලය - ස්ථාවර අනු කමිටු

විභාග පාලක මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය 2012 ජුලි මස 21 සහ 22 යන දිනයන් හි කොළඹ 08. සුසමයවර්ධන විද්‍යාලයේදී පැවැත්වීය.

| | |
|---|---|
| ලිඛිත පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 231 |
| පැමිණි අයැදුම්කරුවන් සංඛ්‍යාව | 151 |
| නොපැමිණි අයැදුම්කරුවන් සංඛ්‍යාව | 80 |

වගු අංක 2.1

2008 සිට 2012 දක්වා පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මගින් පවත්වන ලද ලිඛිත පරීක්ෂණ

| අයිතමය | 2008 වර්ෂය | 2009 වර්ෂය | 2010 වර්ෂය | 2011 වර්ෂය | 2012 වර්ෂය |
|---|---|---|---|---|---|
| ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | **323** | **275** | **402** | **319** | **231** |
| ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගි වූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | **253** | **199** | **296** | **193** | **151** |
| ලිඛිත පරීක්ෂණයෙන් සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව | **29** | **43** | **110** | 53 | 51 |
| ලිඛිත පරීක්ෂණයෙන් ඌණ සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව | **01** | **13** | **49** | 61 | 40 |
| සහභාගි වූ අයැදුම්කරුවන්ගෙන් සමත්වීමේ ප්‍රතිශතය | **11.46%** | **21.61%** | **37.16%** | **31.60%** | **33.77%** |



ප්‍රස්ථාර අංක 2.1

සහභාගි වූ අයැදුම්කරුවන්ගෙන් සමත් වීමේ ප්‍රතිශතය




❖ දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව - ස්ථාවර අනු කමිටු

දණ්ඩණීය අවස්ථා පිළිබඳ කාරක සභාව 1961 අංක 31 දරන පනතේ 10, 18 සහ 82 වගන්තිය ප්‍රකාර පනවා ඇති 1973 ආයුර්වේද ( විනය ) නියෝග වලට අනුගතව පිහිටුවා ඇති ස්ථාවර සභාවකි. එහිදී අනුගමනය කළ යුතු ව්‍යවස්ථානුගත ක්‍රියාවලිය 1973.01.04 දිනැතිව පල කර ඇති අතර එය සාමාන්‍ය විනය පරීක්ෂණයට බෙහෙවින් සංකීර්ණවූත් වගකීම් සහිතවූත් නෛතික විමර්ශන ක්‍රියාවලියකි.

2012 වර්ෂයේ මෙම කාරක සභාව 03 වරක් රැස්වෙන ලදී. එහිදී ව්‍යාජ ලෙස වෛද්‍ය සහතික නිකුත් කිරීම සම්බන්ධව, ලියාපදිංචි අංක 11085 යටතේ ලියාපදිංචිය ලබා ඇති බී.අභයතුංග මහතාගේ ලියාපදිංචිය මාස 03 ක කාලයක් අත්හිටුවීමට හා ඉන් පසු මාස 03 ක කාලයක් පරිවාස කාලයකට යටත් කිරීමටත් තීරණය කරන ලදී. තවද ව්‍යාජ ලෙස වෛද්‍ය සහතික නිකුත් කිරීම සම්බන්ධව, අංක 5570 යටතේ ලියාපදිංචි ආර්.එන්.ඩී.එස්.වීරමන්ත්‍රී මහතා හා අංක 7636 යටතේ ලියාපදිංචි එච්.එම්.පී.පී.හේරත් මහතා මෙම දණ්ඩණීය අවස්ථා කාරක සභාවට පෙනී නොසිටිය බැවින් ඔවුන් දෙදෙනා සම්බන්ධව ඒක පාක්ෂික තීරණ ගැනීමට අදාළ කෙටුම්පත් සකස් කිරීමට යොමු කර ඇත.

## 03. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් නිර්ණය කිරීමේ අනුකම්ටුව

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 62 වන වගන්තිය අනුව ලියාපදිංචි යම් ආයුර්වේද වෛද්‍යවරයෙකු හට තම ලියාපදිංචියෙන් පසුව ලබා ගන්නා වෘත්තියට අදාළ යම් සුදුසුකමක් අතිරේක සුදුසුකමක් ලෙස සභාව පිළිගත් විට එය නාමලේඛනයට ඇතුළත් කිරීමේ බලය හිමිවේ. ඒ අනුව එම අතිරේක සුදුසුකම සඳහා සභාව විසින් නිකුත් කරනු ලබන සහතියක් දැරීමටත්, සිය නම සමඟ ප්‍රදර්ශණය කිරීමටත්, එම අතිරේක සුදුසුකම වෘත්තිය කටයුතු සඳහා භාවිතා කිරීමටත් නෛතික හිමිකම තහවුරු කරනු ලබයි. ආයුර්වේද වෛද්‍ය සභා තීරණය පරිදි මෙම වගන්තියේ විධිවිධාන අනුව අතිරේක සුදුසුකම් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇති අතර මේ වන විට ඒ පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් කර තිබේ. 2012 වර්ෂයේ 04 දෙනකුගේ අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලැබී ඇති අතර 04 දෙනකු සඳහා සහතික පත් නිකුත් කර ඇත.

වගු අංක 3.1

| අයිතමය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| අතිරේක සුදුසුකම් ඇතුළත් කොට සහතික නිකුත් කර ඇති සංඛ්‍යාව | 22 | 16 | 05 | 09 | 04 |

ප්‍රස්ථාර අංක 3.1

අතිරේක සුදුසුකම් ඇතුළත් කර සහතික නිකුත් කළ සංඛ්‍යාව



2012 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව විසින් අනුමත කර ඇති අතිරේක සුදුසුකම් පහතින් දැක්වේ.

| අතිරේක සුදුසුකම | පිරිනැමූ ආයතනය |
|---|---|
| 01. විද්‍යාපති පශ්චාත් උපාධිය | පේරාදෙනිය විශ්ව විද්‍යාලය |
| 02. ආයුර්වේද වෛද්‍ය පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | කොළඹ විශ්ව විද්‍යාලය |
| 03. ආයුර්වේද රෝහල් කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | කැළණිය විශ්ව විද්‍යාලය |

## 04. විමර්ශන කටයුතු

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තීය විෂමාචාර මෙන්ම ලියාපදිංචි නොවූ ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිලි සොයා බලා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ මහජන පැමිණිලි විමර්ශන ඒකකයක් පිහිටුවා ඇත. එම වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා, වෘත්තීය විෂමාචාර, ආයුර්වේද ආචාරධර්ම වලට පටහැනිව ක්‍රියා කිරීම ආදිය විමර්ශනය මෙහි මූලික අරමුණයි. සභාවේ මෙම කාර්යය පුවත්පත් දැන්වීම්, පැමිණිලි හා මහජන පැමිණිලි වශයෙන් වෙන්කොට විමර්ශනය සඳහා යොදා ගැනේ. 2012 වර්ෂය තුළ පැමිණිලි 04 ක පමණ මූලික විමර්ශන අවසන් කොට ඇත.

2012 වර්ෂයේ පහත සඳහන් ආයතන වලින් පැමිණිලි ලැබී ඇත.

01. දකුණු කොළඹ ශික්ෂණ රෝහල. කළුබෝවිල
02. විගණකාධිපති දෙපාර්තමේන්තුව ( දුම්රිය දෙපාර්තමේන්තුව )
03. දුම්රිය දෙපාර්තමේන්තුව
04. අධ්‍යාපන අමාත්‍යාංශය

## 05. විශේෂ වෛද්‍ය මණ්ඩලය

රජයේ හා පෞද්ගලික ආයතන වල සේවයේ නියුතු සේවකයින් සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxvi වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන වෛද්‍ය මණ්ඩලයට සමගාමීව ආයුර්වේද වෛද්‍ය සහතික සම්බන්ධයෙන් අදාළ විශේෂ වෛද්‍ය මණ්ඩල පවත්වනු ලැබේ. ඒ පිළිබඳව සොයා බැලීම සඳහා ඒ ඒ ආයතන මගින් වෛද්‍ය සභාවට පොදු 142 ආකෘති පත්‍රය සම්පූර්ණ කර එවනු ලැබේ. 2012 වර්ෂයේ එවැනි විශේෂ වෛද්‍ය මණ්ඩල 05 ක් පවත්වා ඇත.

වගු අංක 5.1

2012 වර්ෂයේ දී පැවැත් වූ විශේෂ වෛද්‍ය මණ්ඩල වාර්තාව

| ආයතනය | පරීක්ෂණයට භාජනය වූ රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 03 |
| කළාප අධ්‍යාපන කාර්යාලය | 06 |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 01 |
| ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | 01 |
| ශ්‍රී ලංකා කොකා බෙවරේජස් ලිමිටඩ් | 01 |
| සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 01 |
| විශේෂ කාර්ය බලකාය - කොළඹ | 01 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 01 |
| පොලිස් ප්‍රවාහන කොට්ඨාශය | 01 |
| කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 01 |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 01 |
| අනෙකුත් | 01 |

## 06. පනතේ 55(1) හා 55(2) වගන්ති යටතේ ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

ආයුර්වේද වෛද්‍ය සභාව පහත සඳහන් මූලික ප්‍රත්පත්ති මත වෛද්‍යවරු ලියාපදිංචිය සිදු කරයි.

- ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්, අභිඥාණපත්‍රධාරීන් සහ රජය පිළිගත් සහතික පත්‍රධාරීන් සුදුසුකම් අනුව ලියාපදිංචි කිරීම.
- සුදුසුකම්ලත් පාරම්පරික වෛද්‍යවරුන් ආයුර්වේද වෛද්‍ය සභාව සම්මත කරනු ලැබූ ව්‍යවස්ථාව අනුව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල හා නිර්දේශ අනුව ලියාපදිංචි කිරීම

සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයා ලබා ගන්නා ලකුණු ප්‍රමාණය අනුව ශ්‍රේණිගත කිරීමක් සිදුකරන අතර පරීක්ෂණයෙන් අසමත් වන අයැදුම්කරුවන් ඔවුන්ගේ ලකුණු ප්‍රමාණය අනුව මාස තුනක, මාස හයක හා වසරක් ආදී වශයෙන් ඇගැයුම් කාලයකට යටත් කොට නැවත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

2012 වර්ෂය අවසන් වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව 23275 කි. මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍යවරුන් 360 දෙනකු පහත සඳහන් අංශ අනුව ලියාපදිංචි කර ඇත.

වගු අංක 6.1

## 2008 සිට 2012 දක්වා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව

| අයිතමය | 2008 වර්ෂයේ ලියාපදිංචි සංඛ්‍යාව | 2009 වර්ෂයේ ලියාපදිංචි සංඛ්‍යාව | 2010 වර්ෂයේ ලියාපදිංචි සංඛ්‍යාව | 2011 වර්ෂයේ ලියාපදිංචි සංඛ්‍යාව | 2012 වර්ෂයේ ලියාපදිංචි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| සාමාන්‍ය (සර්වාංග) | | | | | |
| උපාධිධාරීන් | 142 | 190 | 161 | 162 | 135 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය | 66 | 63 | 85 | 78 | 80 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කැළණිය විශ්ව විද්‍යාලය | 57 | 82 | 39 | 61 | 25 |
| යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය | 19 | 28 | 24 | 20 | 19 |
| සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - යාපනය විශ්ව විද්‍යාලය | - | 12 | 13 | 03 | 11 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - ඉන්දියාව | - | 05 | - | - | - |
| ඩිප්ලෝමාධාරීන් | 74 | 72 | 91 | 89 | 95 |
| ඩී.ඒ.එම්.එස්. - දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ | 01 | 01 | - | - | - |
| සිද්ධායුර්වේදශුලාභීන් - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | - | 01 | - | - | - |
| ආයුර්වේද ශාස්ත්‍රී | 64 | 62 | 90 | 77 | 84 |
| යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත් | 09 | 08 | 01 | 12 | 11 |
| පාරම්පරික - සර්වාංග | 58 | 48 | 75 | 30 | 45 |
| පාරම්පරික | 58 | 48 | 75 | 30 | 45 |
| පාරම්පරික - විශේෂ | 129 | 165 | 148 | 68 | 84 |
| සර්ප විෂ | 53 | 62 | 38 | 29 | 27 |
| කැඩුම් බිඳුම් | 52 | 78 | 72 | 30 | 44 |
| අක්ෂි රෝග | 02 | 02 | 04 | 02 | 01 |
| චර්ම රෝග | 05 | 06 | 09 | 02 | 01 |
| ගෙඩිවණ | 06 | 08 | 10 | 01 | 05 |
| ජලභීතිකා | 03 | 01 | 01 | - | - |
| දැවුම් පිළිස්සුම් | 01 | 04 | 05 | 01 | 02 |
| මානසික | 07 | 04 | 09 | 03 | 05 |
| මුළු එකතුව | 403 | 475 | 475 | 349 | 359 |

වගු අංක 6.2

2012.12.31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ මුළු ලියාපදිංචි සංඛ්‍යාව

| අයිතමය | 2012.01.01 දින වන විට මුළු ලියාපදිංචි සංඛ්‍යාව | 2012වාර්ෂික ලියාපදිංචි සංඛ්‍යාව | 2012.12.31 දින වන විට මුළු ලියාපදිංචි සංඛ්‍යාව |
|---|---|---|---|
| සාමාන්‍ය (සර්වාංග) | | | |
| උපාධිධාරීන් | 1974 | 135 | 2109 |
| එල්.ඒ.එම්.එස්. - කල්කටා | 52 | - | 52 |
| එෆ්.එම්.බී.එස්. - අලහමාබාද් | 04 | - | 04 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය | 978 | 80 | 1058 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කැළණිය විශ්ව විද්‍යාලය | 310 | 25 | 335 |
| යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය | 296 | 19 | 315 |
| සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - යාපනය විශ්ව විද්‍යාලය | 329 | 11 | 340 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - ඉන්දියාව | 05 | - | 05 |
| ඩිප්ලෝමාධාරීන් | 4929 | 95 | 5024 |
| ඩී.අයි.එම්.එස්. - දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ | 482 | - | 482 |
| ඩී.ඒ.එම්.එස්. - දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ | 1262 | | 1262 |
| ඩී.එස්.ඒ.සී. - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 1166 | - | 1166 |
| ඩී.ඒ.එස්.සී. - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 173 | - | 173 |
| එල්.ඒ.එම්. - යාපනය සිද්ධ විද්‍යාලය | 56 | - | 56 |
| සිද්ධායුර්වේදඥලාභීන් - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 568 | - | 568 |
| ආයුර්වේද ශාස්ත්‍රී | 1133 | 84 | 1217 |
| යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත් | 89 | 11 | 100 |
| පාරම්පරික - සර්වාංග | 5295 | 45 | 5340 |
| පාරම්පරික | 5295 | 45 | 5340 |
| පාරම්පරික - විශේෂ | 8155 | 84 | 8239 |
| සර්ප විෂ | 3442 | 27 | 3469 |
| කැඩුම් බිඳුම් | 2138 | 44 | 2182 |
| අක්ෂි රෝග | 625 | 01 | 626 |
| චර්ම රෝග | 528 | 01 | 529 |
| ගෙඩිවණ | 355 | 05 | 360 |
| ජලභීතිකා | 180 | - | 180 |
| දවුම් පිළිස්සුම් | 78 | 02 | 80 |
| මානසික | 144 | 05 | 149 |
| විදුම් පිළිස්සුම් | 07 | - | 07 |
| වෙනත් | 658 | - | 658 |
| එකතුව ( සර්වාංග / විශේෂ ) | 20353 | | 20712 |
| මියගොස් ඇති වෛද්‍යවරුන් | 2563 | | 2563 |
| මුළු එකතුව ( සර්වාංග / විශේෂ / මියගොස් ඇති ) | 22916 | 359 | 23275 |

ප්‍රස්ථාර අංක 6.1

2012.12.31 දක්වා මුළු ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්




2012 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල 20 ක් ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ හා ජංගම කාර්යාල මගින් පවත්වා ඇත. එහිදී,

| | |
|---|---|
| 2012 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් ලද සංඛ්‍යාව | 386 |
| සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වූ සංඛ්‍යාව | 290 |
| ලියාපදිංචි සඳහා සුදුසුකම් ලැබූ සංඛ්‍යාව | 136 කි. |



වගු අංක 6.3

2008 සිට 2012 දක්වා පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මගින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සටහන

| අයිතමය | 2008 වර්ෂය | 2009 වර්ෂය | 2010 වර්ෂය | 2011 වර්ෂය | 2012 වර්ෂය |
|---|---|---|---|---|---|
| වාර්ෂිකව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සංඛ්‍යාව | 69 | 65 | 27 | 26 | 20 |
| වාර්ෂිකව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ අයදුම්කරුවන් සංඛ්‍යාව | 953 | 865 | 450 | 404 | 386 |
| වාර්ෂිකව සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වූ අයදුම්කරුවන් සංඛ්‍යාව | 717 | 600 | 315 | 315 | 290 |
| සම්මුඛ පරීක්ෂණ මගින් ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් සංඛ්‍යාව | 178 | 287 | 140 | 85 | 136 |
| සහභාගී වූ අයදුම්කරුවන්ගෙන් සමත් වීමේ ප්‍රතිශතය | 24.82% | 47.83% | 44.44% | 26.98% | 46.89% |



ප්‍රස්ථාර අංක 6.2

සහභාගී වූ අයදුම්කරුවන්ගෙන් සමත් වීමේ ප්‍රතිශතය



## 07. ආයුර්වේද සාත්තු සේවකයින් හා හෛෂජ්‍යකවරුන් ලියාපදිංචි කිරීම

ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් සාත්තු සේවකයින් වශයෙන් පුහුණු කිරීමට බඳවාගෙන ඇති අයදුම්කරුවන් 30 දෙනාගෙන් 27 දෙනකු ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇත. මොවුන්ගේ අවසාන විභාගය සමත් සහතික පත්‍රය ඉදිරිපත් කර නොමැති බැවින් ලියාපදිංචි සහතික නිකුත් කිරීම මෙතෙක් සිදු කර නොමැත.

කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යාතනය මගින් හෛෂජ්‍යක පාඨමාලාව අවසන් කළ හෛෂජ්‍යකවරුන් 44 දෙනකු 2012 වර්ෂයේ ලියාපදිංචිය ලබා ඇති අතර කැළණිය විශ්ව විද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය විද්‍යාතනය මගින් හෛෂජ්‍යක පාඨමාලාව අවසන් කළ හෛෂජ්‍යකවරුන් 23 දෙනා අතුරින් 2012 වර්ෂය අවසන් වන විට 18 දෙනකු ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අයැදුම්පත් භාර දී ඇත. ඔවුන් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

| අයිතමය | 2012 | |
|---|---|---|
| | අයදුම්පත් සංඛ්‍යාව | ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව |
| ආයුර්වේද සාත්තු සේවකයින් - හෙද නිලධාරීන් | 27 | 00 |
| හෛෂජ්‍යකවරුන් | 62 | 44 |

## 08. ව්‍යවස්ථා සම්පාදනය

නවක හෙද ලියාපදිංචිය පිළිබඳ අනුකමිටුව

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 56 වන වගන්තිය යටතේ ආයුර්වේද හෙද නිළධරයන් ලියාපදිංචි කිරීමේ නීතිමය බලය පැවරී ඇත්තේ ආයුර්වේද වෛද්‍ය සභාවටය. ඒ අනුව 2010.09.23 දින සභාව මගින් නවක හෙද නිලධරයන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය සියළුම නෛතික ලියකියවිලි හා අනෙකුත් අවශ්‍යතා සකස් කිරීම සඳහා අනු කමිටුවක් පත් කරන ලදී.

එම කමිටුව හෙද නිළධරයන් ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය, ලියාපදිංචි සහතිකය, ලියාපදිංචි කිරීමේ ලේඛනය, අයදුම්පත්‍රය හා ලියාපදිංචි ගාස්තුව සහ හැඳුනුම්පත් සකස් කිරීම පිළිබඳ ගන්නා ලද තීරණ සඳහා 2010.10.29 දින සභාවේ අනුමැතිය ලැබුණි. ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද ලිඛිත හා වාචික පරීක්ෂණයෙන් තෝරාගන්නා හෙද නිලධරයන්ගෙන් සාර්ථකව හෙද පුහුණු පාඨමාලාව අවසන් කරන අයදුම්කරුවන් ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීමට සියළු කටයුතු සිදු කර ඇත.




09. "හෙළ වෙද රුවනාර" වැඩ සටහන

මහින්ද චින්තන ජාතික වැඩ පිළිවල යටතේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන "හෙළ වෙද පුනරුද" වැඩ සටහනට සමගාමීව ආයුර්වේද වෛද්‍ය සභාවේ මෙහෙයවීමෙන් "හෙළවෙද රුවනාර" වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදී.
ඒ යටතේ,

1. ආයුර්වේද වෛද්‍ය සභාවේ ජංගම සේවා කවුළුවක් මගින් පහත සඳහන් කටයුතු ඉටු කිරීම.
   - පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචියට අවශ්‍ය අයදුම්පත් නිකුත් කිරීම
   - පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචියට අදාළ අයදුම්පත් භාර ගැනීම
   - ලියාපදිංචිය සඳහා එවන ලද අයදුම්පත් වල අඩුපාඩු සැකසීම
   - ලියාපදිංචි අපේක්ෂිතයින්ගේ ගැටළු විසඳීම
   - ආයුර්වේද වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම
   - ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වාහන ලාංඡන නිකුත් කිරීම.
   - ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම.
   - ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ තොරතුරු යාවත් කාලීන කිරීම.

2. පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

3. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වෘත්තිය සංවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම

4. වයස අවුරුදු 70 ඉක්ම වූ මෙතෙක් ලියාපදිංචිය නොලත් වෛද්‍යවරුන් වෙත ගොස් ඔවුන් සඳහා ලියාපදිංචිය පිරිනැමීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම

5. හෙළවෙද රැකවරණ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක නොවූ වෛද්‍යවරුන් ඒ සඳහා දායක කර ගැනීම සිදු කරන ලදී.



| දිනය | ස්ථානය | | සහභාගිත්වය |
|---|---|---|---|
| 2012.01.27 | අනුරාධපුර පළාත් සමූපකාර අමාත්‍යාංශ ශ්‍රවණාගාරය | | 280 |
| | ස්වර්ණ මුද්‍රිකා ලාභී වෛද්‍යවරු සංඛ්‍යාව | 54 | |
| | විශිෂ්ඨ සේවා මුද්‍රිකා ලාභී වෛද්‍යවරුන් සංඛ්‍යාව | 02 | |
| 2012.06.01 | කුරුණෑගල පළාත් සභා ශ්‍රවණාගාරය | | 370 |
| | ස්වර්ණ මුද්‍රිකා ලාභී වෛද්‍යවරු සංඛ්‍යාව | 277 | |
| 2012.10.13 | ගම්පහ බණ්ඩාරනායක විදුහල් ශ්‍රවණාගාරය | | 500 |
| | ස්වර්ණ මුද්‍රිකා ලාභී වෛද්‍යවරු සංඛ්‍යාව | 237 | |
| 2012.10.27 | හම්බන්තොට චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල | | 75 |
| | ස්වර්ණ මුද්‍රිකා ලාභී වෛද්‍යවරු සංඛ්‍යාව | 25 | |



වගු අංක 9.1

2008 සිට 2012 දක්වා පැවැත් වූ "හෙළවෙද රුවනාර" වැඩසටහන් පිළිබඳ වාර්තාව

| අයිතමය | 2008 වර්ෂය | 2009 වර්ෂය | 2010 වර්ෂය | 2011 වර්ෂය | 2012 වර්ෂය |
|---|---|---|---|---|---|
| වාර්ෂිකව පවත්වන ලද වෘත්තිය සංවර්ධන වැඩ සටහන් සංඛ්‍යාව - හෙළවෙද රුවනාර | - | 03 | 03 | 04 | 04 |
| සහභාගිත්වය | - | 898 | 832 | 1233 | 1225 |
| එක් වැඩ සටහනක් සඳහා සහභාගිත්වයේ සාමාන්‍ය | 00 | 300 | 277 | 308 | 306 |

ප්‍රස්ථාර අංක 9.1

එක් වැඩ සටහනක් සඳහා සහභාගිත්වයේ සාමාන්‍ය






## 10. ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලය

1961 අංක 31 දරන ආයුර්වේද පනත මගින් ස්ථාපිත ආයුර්වේද වෛද්‍ය සභාව ව්‍යවස්ථාපිත ආයතනයකි. එහි කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අනුමත බඳවා ගැනීම් පටිපාටියක් 2010 වර්ෂය අවසන් වන විටත් නොමැති විය. සභාව විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ උපදෙස් මත සකස් කරන ලද බඳවාගැනීමේ පටිපාටි සඳහා 2011.12.12 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලැබී ඇත.

එසේම 2011.05.23 දිනැතිව සභාවේ සේවක සංඛ්‍යාව ද එම දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇත.

| තරාතිරම | තත්‍ය සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව |
|---|---|---|
| ලේඛකාධිකාරී * | 01 | 01 |
| කළමනාකරණ සහකාර | 09 | 09 |
| කාර්යාල කම්කරු | 02 | 02 |

* කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති අතර අනුමත මාසික ස්ථාවර දීමනාවක් ගෙවනු ලැබේ.

ආයුර්වේද වෛද්‍ය සභාවේ සේවකයින්ගෙන් කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබා ගැනීම සඳහා කාර්යමණ්ඩලය විවිධ පුහුණුවීම් සඳහා සහභාගී කරවනු ලැබේ. සේවක පුහුණු වීම් සඳහා 2012 වර්ෂයේ වෙන් කර ඇති මුදල රු.225,000/-කි.

වගු අංක 10.1

2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාර්යමණ්ඩල පුහුණු පිළිබඳ වාර්තාව

| පුහුණුව ලැබූ ආයතනය | පාඨමාලාව | සහභාගී වූ සේවක සංඛ්‍යාව |
|---|---|---|
| | 2008 වර්ෂය | |
| රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය | 01. කාර්යාල ලිපි කටයුතු හා සංනිවේදනය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 |
| | 2. කාර්යාල කටයුතු පිළිබඳ උසස් පරිගණක පාඨමාලාව | 02 |
| | 3. මූලික විදේශ අරමුදල් ව්‍යාපෘති පිළිබඳ පුහුණු වැඩසටහන | 01 |
| | 4. පරිගණක නඩත්තු පිළිබඳ පාඨමාලාව | 03 |
| | 5. අන්තර් ජාලය හා විද්‍යුත් තැපැල පිළිබඳ පාඨමාලාව | 01 |
| | 6. පොදු කාර්යාල හා උසස් ගිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ පාඨමාලාව | 01 |
| | 7. පොදු මූල්‍ය හා ගිණුම් නිපුනතා සංවර්ධනය පිළිබඳ පාඨමාලාව | 01 |
| | 8. පුද්ගලික ලිපිගොනු නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන | 01 |

| 2009 වර්ෂය | | |
|---|---|---|
| රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය | 1. පොත් තැබීම හා මුදල් කටයුතු පිළිබඳ පාඨමාලාව<br>2. පරිගණක පිළිබඳ මූලික පාඨමාලාව<br>3. **M S Word** පිළිබඳ පුහුණු වැඩ සටහන<br>4. ගිණුම් ලිපිකරු නිපුනතා සංවර්ධන පුහුණු පාඨමාලාව | 01<br>01<br>01<br>01 |
| 2010 වර්ෂය | | |
| රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය | 1. පරිගණක නඩත්තු පිළිබඳ පාඨමාලාව<br>2. පරිගණක පිළිබඳව ජාත්‍යාන්තර පාඨමාලාව<br>3. දෙමළ භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01<br>01<br>02 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | 1. මූලික ගිණුම්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 |
| 2011 වර්ෂය | | |
| රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය<br>ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය | 1. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව<br>1. පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය | 02<br>01 |
| 2012 වර්ෂය | | |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | විනය කාර්ය පරිපාටි | 03 |

වගු අංක 10.2

වර්ෂ 2008 සිට 2012 දක්වා පුහුණු පාඨමාලා ගාස්තු පිළිබඳ වාර්තාව

| අයිතමය | 2008 වර්ෂය | 2009 වර්ෂය | 2010 වර්ෂය | 2011 වර්ෂය | 2012 වර්ෂය |
|---|---|---|---|---|---|
| වාර්ෂිකව වෙන්කර ඇති මුදල රු. | 125,000/- | 195,000/- | 225,000/- | 225,000/- | 225,000/- |
| පුහුණු සඳහා වැය වූ මුදල රු. | 71,550/- | 90,000/- | 65,000/- | 63,000/- | 22,500/- |
| ඉතිරි මුදල රු. | 53,450/- | 105,000/- | 160,000/- | 162,000/- | 202,500/- |

## 11. ආයුර්වේද වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවිය

රාජ්‍ය අංශයේ මෙන්ම ව්‍යාපාරික අංශයේ ප්‍රජාවගේ ආයුර්වේද වෛද්‍යවරුන් සම්බන්ධ විශේෂ අවධානය යොමු වී ඇති මෙම කාලසීමාවේ එම කටයුතු පහසු කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය තොරතුරු අන්තර්ජාලය මඟින් මුදාහැරීමට වෙබ් අඩවියක් ආරම්භ කිරීම සඳහා සභාව 2009 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මෙන් අනුමැතිය දී තිබුණි. එම කටයුත්ත 2010.09.27 දින සඵල කර ගනිමින් ආයුර්වේද වෛද්‍ය සභාවේ **www.ayurvedicmedicoun.gov.lk** නිල වෙබ් අඩවිය අන්තර්ජාලයට මුදා හරින ලදී. ආයුර්වේද ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා හා ලියාපදිංචි හා ලියාපදිංචි අපේක්ෂිත ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා අවශ්‍යවන මාර්ගෝපදේශ, නීති රෙගුලාසි හා අනෙකුත් නෛතික තත්වයන් රාජ්‍ය අංශයේ මෙන්ම ව්‍යාපාරික අංශයේ ප්‍රජාවගේ අවශ්‍යතාවය අනුව මෙමඟින් එළිදැක්වීමට ද අදහස් කර තිබේ. 2012 වර්ෂය අවසන් වන විට ලියාපදිංචි වෛද්‍යවරුන් 6000 පමණ තොරතුරු වෙබ් අඩවියට ඇතුළත් කර ඇත.




## 12. 2012 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණවලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් පියවර

1. 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 81 වගන්තිය ප්‍රකාරව උප්පැන්න මරණ රෙජිස්ටාර්වරුන් විසින් මියගොස් ඇති බව දන්වා එවා ඇති වෛද්‍යවරුන් 19 දෙනකුගේ නම් ලියාපදිංචි නාමලේඛනයෙන් ඉවත් කර ඇත.

| අයිතමය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| මියගොස් ඇති බව දන්වා එවා ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව | 00 | 08 | 27 | 27 | 19 |

2. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ සහයෝගය ඇතිව නවක ලියාපදිංචි වෛද්‍යවරුන් සඳහා වෘත්තිය සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම. 2012 වර්ෂය තුලදී නවක ලියාපදිංචි වෛද්‍යවරුන් 276 දෙනකු සඳහා වැඩසටහන් පවත්වා ඇත.

| අයිතමය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| සහභාගිත්වය | 00 | 107 | 117 | 126 | 276 |



3. රජයේ හා පෞද්ගලික ආයතන වල සේවයේ නියුතු සේවකයින් සඳහා 2012 වර්ෂයේ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ලබා දෙනු ලැබූ වෛද්‍ය සහතික 222 කට අදාළ තහවුරු කිරීම් සිදුකර ඇත.

| අයිතමය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදු කල සංඛ්‍යාව | 320 | 392 | 355 | 250 | 222 |

4. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් 21236 දෙනකුගේ තොරතුරු පරිගණක ගත කිරීම අවසන් කර ඇති අතර එම තොරතුරු පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ. පරිගණක ගත කර ඇති වෛද්‍යවරුන් අතුරින් 12411 දෙනකුගේ තොරතුරු යාවත් කාලීන කර ඇත.

5. 2012 වර්ෂය තුළ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් 671 දෙනකු හැදුනුම්පත් ලබා ගැනීම සඳහා අයැදුම්කර ඇති අතර 671 දෙනෙකු වෙත සකස් කරන ලද හැදුනුම්පත් නිකුත් කර ඇත.

| අයිතමය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| හැදුනුම්පත් නිකුත් කළ සංඛ්‍යාව | 00 | 00 | 541 | 109 | 671 |

**6.** ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වාහන නිල ලාංඡන නිකුත් කිරීම.

| අයිතමය | 2012 |
|---|---|
| වාහන නිල ලාංඡන නිකුත් කළ සංඛ්‍යාව | 335 |

**7.** ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා ජාත්‍යාන්තර සහතික නිකුත් කිරීම.

| අයිතමය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| ජාත්‍යාන්තර සහතික නිකුත් කළ සංඛ්‍යාව | 09 | 14 | 12 |

ඉහත කරුණු අනුව ආයුර්වේද වෛද්‍ය සභාව 2012 වර්ෂය තුළ එහි පරමාර්ථ ඉටුවන අයුරින් කටයුතු කර ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමි. වෛද්‍ය සභාවේ පාලනයෙන් තොර හේතු මත ආයුර්වේද සාත්තු සේවකයින් ලියාපදිංචි කිරීම, භෛෂජ්‍යකවරුන් ලියාපදිංචි කිරීම හා ආයුර්වේදය උගන්වන ආයතන ලියාපදිංචි කිරීම වැනි අනෙකුත් අරමුණු ඉටු කිරීමට නොහැකි වූ බවත් එම අරමුණු 2013 වර්ෂයේ දී ඉටු කර ගැනීමට හැකි ලෙස මූලික කටයුතු ආරම්භ කර ඇති බවත් සඳහන් කරමි.

අ/කලේ.පී.එස්.කේ.ආර්.වීරකෝන්
ආයුර්වේද කොමසාරිස් සහ
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,

2013.09.11 දින
මහරගම,
නාවින්න,
පරණ කොට්ටාව පාරේ,
ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ දී.



## ආයුර්වේද වෛද්‍ය සභාව
## 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| විස්තරය | 2012.12.31 | 2011.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| **01. අයභාරය - රජයේ ප්‍රතිපාදන** | **4,700,000.00** | **3,900,000.00** |
| **02. වෙනත් මෙහෙයුම් ආදායම්** | **2,361,369.00** | **1,900,665.00** |
| ලියාපදිංචි ගාස්තු | 690,000.00 | 630,000.00 |
| සම්මුඛ පරීක්ෂණ ගාස්තු | 158,400.00 | 173,250.00 |
| ලියාපදිංචි ඉල්ලුම්පත්‍ර ගාස්තු | 365,530.00 | 288,650.00 |
| ලිඛිත පරීක්ෂණ ගාස්තු | 146,125.00 | 165,800.00 |
| සේවක ණය පොළී | 39,428.00 | 39,035.00 |
| පාරිතෝෂික ආයෝජන පොළිය | 71,631.00 | - |
| වාහන ලාංඡන නිකුත් කිරීමේ ගාස්තු | 166,000.00 | - |
| සහතික පිටපත් ගාස්තු | 27,750.00 | 44,800.00 |
| තැපැල් ආදායම් | 78,355.00 | 41,120.00 |
| වෛද්‍ය සහතික පොත් ගාස්තු | 251,200.00 | 236,200.00 |
| වෛද්‍ය හැඳුනුම්පත් ගාස්තු | 196,250.00 | 115,000.00 |
| නම් වෙනස් කිරීමේ ගාස්තු | 3,500.00 | 6,000.00 |
| නාමලේඛන පිටපත් ගාස්තු | 4,277.00 | 2,382.00 |
| අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීමේ ගාස්තු | 5,250.00 | 11,600.00 |
| විවිධ ආදායම් | 97,673.00 | 71,828.00 |
| ජාත්‍යන්තර සහතික පිටපත් ගාස්තු | 60,000.00 | 75,000.00 |
| **03. මුළු ආදායම ( 01 + 02 )** | **7,061,369.00** | **5,800,665.00** |
| **04. පරිපාලන වියදම්** | **6,809,911.00** | **6,790,628.00** |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 3,025,024.00 | 3,104,523.00 |
| සේවක අර්ථ සාධක අරමුදල | 310,152.00 | 323,126.00 |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 77,538.00 | 80,782.00 |
| විවිධ වියදම් | 140,076.00 | 99,694.00 |
| ගමන් වියදම් | 84,174.00 | 115,406.00 |
| වෛද්‍ය හැඳුනුම්පත් ගාස්තු | 88,084.00 | 71,519.00 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 218,693.00 | 232,571.00 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 175,980.00 | 194,223.00 |
| තැපැල් ගාස්තු | 119,875.00 | 150,249.00 |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 543,600.00 | 275,800.00 |
| අතිකාල වියදම් | 322,565.00 | 409,675.00 |
| සංග්‍රහ වියදම් | 197,368.00 | 215,472.00 |
| විගණන ගාස්තු | 60,000.00 | 60,000.00 |
| දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍ර | 54,090.00 | 42,300.00 |
| අනු කමිටු දීමනා | 50,000.00 | 36,200.00 |
| දුරකතන ගාස්තු | 71,279.00 | 99,270.00 |
| පුවත්පත් ගාස්තු | 22,790.00 | 24,705.00 |
| දුම්රිය බලපත්‍ර ගාස්තු | 17,110.00 | 6,850.00 |
| රක්ෂණ ගාස්තු | 10,482.00 | - |
| පාරිතෝෂික දීමනා | 214,429.00 | 123,493.00 |
| මුද්‍රණ ගාස්තු | 208,066.00 | 173,858.00 |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා | 108,089.00 | 98,269.00 |
| දැන්වීම් ගාස්තු | 163,341.00 | 21,504.00 |
| ලිඛිත පරීක්ෂණ ගාස්තු | 148,618.00 | 150,120.00 |
| කුළීරථ ගාස්තු | 231,558.00 | 498,678.00 |
| සේවක පුහුණු ගාස්තු | 22,500.00 | 63,250.00 |
| විදුලි ගාස්තු | 124,430.00 | 119,091.00 |
| **05. වෙනත් මෙහෙයුම් වියදම්** | **348,278.00** | **364,370.00** |
| වාර්ෂික ක්ෂය කිරීම් | 307,423.00 | 281,956.00 |
| පෙරවර්ෂ ගැලපුම් ගිණුම | 40,855.00 | - |
| කාර්යාල උපකරණ ඉවත් කිරීම | - | 82,414.00 |
| **06. මුළු වියදම ( 04 + 05 )** | **7,158,189.00** | **7,154,998.00** |
| **07. වාර්ෂික ඌණතාවය / අතිරික්තය ( 03 - 06 )** | **(96,820.00)** | **(1,354,333.00)** |

සකස් කලේ -

| | | |
|---|---|---|
| **වෛද්‍ය එච්.බැසිල් රංජිත් ප්‍රනාන්දු** | **පී.එස්.කේ.ආර්.වීරකෝන්** | **ප්‍රභාත් ගුණසේකර** |
| **එච්.බැසිල් රංජිත් ප්‍රනාන්දු** | **සභාපති,** | කළමනාකරණ සහකාර |
| ආයුර්වේද වෛද්‍ය සභාව | ආයුර්වේද වෛද්‍ය සභාව | ආයුර්වේද වෛද්‍ය සභාව |

# ආයුර්වේද වෛද්‍ය සභාව
## 2012.12.31 දිනට ශේෂ පත්‍රය

| | 2012.12.31 රුපියල් | | 2011.12.31 රුපියල් | |
|---|---|---|---|---|
| **වත්කම** | | | | |
| දේපල, පිරියත හා උපකරණ ( ගත්මිල ) | 3,923,942.00 | | 3,509,438.00 | |
| සමුච්චිත ක්ෂය | 2,356,744.00 | | 2,049,321.00 | |
| දේපල, පිරියත හා උපකරණ (ශුද්ධ අගය) | | 1,567,198.00 | | 1,460,117.00 |
| **වෙනත් මූල්‍ය වත්කම්** | | | | |
| පාරිතෝෂික දීමනා ආයෝජන | | 1,168,203.00 | | 1,214,264.00 |
| **ජංගම වත්කම්** | | | | |
| ණය ගැතියෝ | 837,600.00 | | 886,328.00 | |
| ලිපිද්‍රව්‍ය තොගය | 175,650.00 | | 198,933.00 | |
| තැපැල් මුද්දර තොගය | 30,125.00 | | - | |
| මුදල් ශේෂය | 22,108.00 | | 79,474.00 | |
| | | 1,065,483.00 | | 1,164,735.00 |
| | | **3,800,884.00** | | **3,839,116.00** |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිතය** | | | | |
| සංචිත | 2,449,302.00 | | 3,810,781.00 | |
| සමුච්චිත ඌණතාවය / අතිරික්තය | (96,820.00) | | (1,354,333.00) | |
| | 2,352,482.00 | | 2,456,448.00 | |
| **අඩු කළා / එකතු කළා** | | | | |
| පෙරවර්ෂ ගැලපුම් ගිණුම | 40,855.00 | 2,393,337.00 | 7,146.00 | 2,449,302.00 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| පාරිතෝෂික දීමනා වෙන්කිරීම | | 1,168,203.00 | | 1,214,264.00 |
| **ජංගම වගකීම්** | | | | |
| විගණන ගාස්තු | 62,208.00 | | 60,000.00 | |
| දුරකතන ගාස්තු | 4,716.00 | | 3,122.00 | |
| පුවත්පත් ගාස්තු | 2,480.00 | | 2,260.00 | |
| අතිකාල දීමනා | 15,096.00 | | 31,332.00 | |
| ඉදිරි වර්ෂය සඳහා ලියාපදිංචි ගාස්තු | 53,000.00 | | 10,000.00 | |
| දැන්වීම් ගාස්තු | 78,400.00 | | - | |
| හැඳුනුම්පත් ගාස්තු | - | | 13,000.00 | |
| විදුලි ගාස්තු | 8,064.00 | | 10,000.00 | |
| ලිඛිත පරීක්ෂණ ගාස්තු | - | | 1,625.00 | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 9,000.00 | | 42,971.00 | |
| දුම්රිය බලපත්‍ර | 6,380.00 | | 1,240.00 | |
| | | 239,344.00 | | 175,550.00 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **3,800,884.00** | | **3,839,116.00** |

සකස් කළේ

**වෛද්‍ය, එච්.බැසිල් රංජිත් ප්‍රනාන්දු**
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභාව

**පී.එස්.කේ.ආර්.වීරකෝන්**
සභාපති,
ආයුර්වේද වෛද්‍ය සභාව

**ප්‍රභාත් ගුණසේකර**
කළමනාකරණ සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

## ආයුර්වේද වෛද්‍ය සභාව
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය - 2012/01/01 සිට 2012/12/31 දක්වා

| | අඩුවීම් රු. | එකතුවීම් රු. | රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ආදායම** | | | |
| පොලී ආදායමට පෙර අතිරික්තය | | | **(96,820.00)** |
| **මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයන් ගැලපීම** | | | |
| කාර්ය මණ්ඩල ණය පොලී | 39,428.00 | | |
| පාරිතෝෂික ආයෝජන පොලිය | 71,631.00 | | |
| වාර්ෂික ක්ෂය | | 307,423.00 | |
| පෙරවර්ෂ ගැලපුම් ගිණුම | | 40,855.00 | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 214,429.00 | |
| | 111,059.00 | 562,707.00 | 451,648.00 |
| | | | 354,828.00 |
| **කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය** | | | |
| **කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම** | | | |
| ණය ගැතියෝ | | 48,728.00 | |
| තොගය ( ලිපිද්‍රව්‍ය ) | | 23,283.00 | |
| තැපැල් මුද්දර තොගය | 30,125.00 | | |
| විගණන ගාස්තු | | 2,208.00 | |
| උපචිත දුරකතන ගාස්තු | | 1,594.00 | |
| උපචිත පුවත්පත් ගාස්තු | | 220.00 | |
| උපචිත අතිකාල ගාස්තු | 16,236.00 | | |
| උපචිත දුම්රිය බලපත්‍ර ගාස්තු | | 5,140.00 | |
| උපචිත ලිඛිත පරීක්ෂණ | 1,625.00 | | |
| උපචිත කාර්යමණ්ඩල වැටුප් හා දීමනා | 33,971.00 | | |
| උපචිත හැඳුනුම්පත් ගාස්තු | 13,000.00 | | |
| ඉදිරිවර්ෂය සඳහා ලි.ප.ගාස්තු | | 43,000.00 | |
| උපචිත විදුලි ගාස්තු | 1,936.00 | | |
| දැන්වීම් ගාස්තු | | 78,400.00 | |
| | 96,893.00 | 202,573.00 | 105,680.00 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | 460,508.00 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | 414,504.00 | | |
| පාරිතෝෂික ආයෝජන පොලිය | | 71,631.00 | |
| පාරිතෝෂික දීමනා | 214,429.00 | | |
| | 628,933.00 | 71,631.00 | (557,302.00) |
| **මුදල් හා සමාන විෂයන්ගේ අඩුවීම** | | | (96,794.00) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| කාර්ය මණ්ඩල ණය පොලී | | | 39,428.00 |
| | | | (57,366.00) |
| **වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන විෂයන්** | | | |
| බැංකු ගිණුම | | | 79,474.00 |
| වර්ෂය අවසානයේ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | **22,108.00** |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන විෂයන්** | | | |
| බැංකු ගිණුම | | | 22,108.00 |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන විෂයන්ගේ අඩුවීම | | | **22,108.00** |

සකස් කළේ :- ප්‍රභාත් ගුණසේකර

කළමනාකරණ සහකාර - ආයුර්වේද වෛද්‍ය සභාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: එච්එම්/සී/ඒඑම්සී/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date: 2013 සැප්තැම්බර් 05 දින

සභාපති,
ආයුර්වේද වෛද්‍ය සභාව.

**ආයුර්වේද වෛද්‍ය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 කොටසෙහි 11-21 දක්වා ඡේද සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් වෛද්‍ය සභාවේ සභාපති වෙත 2013 අප්‍රේල් 22 දින නිකුත් කරන ලදි.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028-34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / மின்-அஞ்சல் / E-mail. oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වෛද්‍ය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයුර්වේද වෛද්‍ය සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

<u>විගණන මතය</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතයවේ.

## 2:2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2:2.1. ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය

(අ) වාහන ලාංඡන නිකුත් කිරීමේ ගාස්තු ලෙස රු.28,000 ක් හා නාමලේඛන පිටපත් ගාස්තු ලෙස රු.260 ක් අදාල ගිණුම්වල නිවැරදිව සටහන් කොට නැවත එම වටිනාකම් වල එකතුව වන රු.28,260 ක් විවිධ ආදායම් ගිණුමටද බැර කර තිබුණි. මේ නිසා වර්ෂයේ ආදායම රු.28,260 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා රු.16,734 ක් හා දුරකථන ගාස්තු රු.980 ක් ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ ස්ථාවර වත්කම් අපහරණය කිරීමෙන් පසු ඉවත්කිරීමේ ගිණුමෙහි වූ රු.44,270 ක පාඩුව සම්පූර්ණ අලාභයක් ලෙස ගිණුම්ගතකර තිබුණ අතර ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද රු. 15,650 ක මුදල ගිණුම් වලට ගලපා නොතිබුණි.

### 2:2:2. විගණනය සඳහා සාක්ෂි නොවීම

2012 දෙසැම්බර් 31 දින වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වූ වෛද්‍යවරුන් භෛසජ්ජකවරුන් හා හෙදියන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කළ ලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද අන්තර්ජාලය මගින් ප්‍රකාශයට පත්කර තිබුණු ලියාපදිංචි වෛද්‍යවරු පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර නොතිබුණු අතර එක් එක් දිස්ත්‍රික්කය අනුව යාවත්කාලීන කළ ලේඛණයක් පිළියෙල කර නොතිබුණි.

### 2:2:3. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් අනාවරණය විය.

(අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ III වන කොටසේ 11(1)(ඉ) වගන්තිය ප්‍රකාර ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් අතරින් තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයින් 3 දෙනෙකු ද, සභාවේ සංයුතියට ඇතුළත් විය යුතු වුවද, සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් කිසිවකු ඇතුළත්ව නොතිබුණි.

(ආ) 2005 ජූලි 15 දිනැති අංක 14/ 13/08(3) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව අනුව 2006 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂ 05 කට වරක් වෛද්‍යවරුන් තම ලියාපදිංචිය යාවත්කාලීන කර ගත යුතුය. තවද ඒ සඳහා ලියාපදිංචි ගාස්තුවක් අයකළ යුතු බවට තීරණය කර තිබුණත් 2012 දෙසැම්බර් 31 දින වන විටද එය ඉටුකර නොතිබුණි. තවද මෙම තීරණය

ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය අවහිරතා පැවතීමත් ඒ පිළිබඳ සංශෝධන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බවත්, සංශෝධිත ආචාරධර්ම අනුමත වීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කිරීමට 2012 අප්‍රේල් 03 දින වෛද්‍ය සභාව තීරණය කර ඇති බව දන්වා ඇතත්, එම නීති කෙටුම්පත් 2013 ජුනි දක්වා අනුමත කරගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ කටයුතුවල මෙහෙයුම් ප්‍රතිඵලය රු.96,820 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,354,333 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.1,257,513 ක ඌණතාවයේ අඩුවීමක් පෙන්නුම් කෙරිණි. මුළු ආදායම ඉකුත් වර්ෂයේ ආදායමට වඩා සියයට 22 ක් හෙවත් රු.1,260,704 කින් වැඩිවීම එම ඌනතාවය අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ මෙහෙයුම් කටයුතු සහ ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචන විස්තර පහත දැක්වේ.

| | 2012 වර්ෂය | 2011 වර්ෂය | (අඩුවීම/වැඩිවීම) | ප්‍රතිශතය (අඩුවීම/වැඩිවීම) |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| අයභාරය- රජයේ ප්‍රතිපාදන | 4,700,000 | 3,900,000 | 800,000 | 21 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 2,361,369 | 1,900,665 | 460,704 | 25 |
| මුළු ආදායම | 7,061,369 | 5,800,665 | 1,260,704 | 22 |
| පරිපාලන වියදම් | 6,809,911 | 6,790,628 | 19,283 | 1 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 348,278 | 364,370 | (16,092) | (5) |
| මුළු වියදම | 7,158,189 | 7,154,998 | 3,191 | 0 |
| වාර්ෂික ඌනතාවය/ අතිරික්තය | (96,820) | (1,354,333) | 1,257,513 | 93 |

2012 වර්ෂයේදී මුළු ආදායම රු.1,260,704 ක් හෙවත් 22% කින් වැඩි වුවද මුළු වියදම වැඩිවී තිබුණේ රු.3,191 කින් පමණි.

4

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1. **කාර්ය සාධනය**

4.1.1. **වෛද්‍යවරුන් ලියා පදිංචි කිරීම**

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ දෙකක ලියාපදිංචි වෛද්‍යවරුන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2012 දෙසැම්බර් 31 දිනට | 2011 දෙසැම්බර් 31 දිනට | 2010 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|
| **සර්වාංග** | | | |
| උපාධිධාරීන් | 2,109 | 1974 | 1812 |
| ඩිප්ලෝමාධාරීන් | 5,024 | 4929 | 4840 |
| පාරම්පරික | 5,340 | 5295 | 5265 |
| **පාරම්පරික විශේෂ** | | | |
| සර්ප විෂ | 3,469 | 3442 | 3413 |
| කැඩුම් බිඳුම් | 2,182 | 2138 | 2108 |
| අක්ෂි රෝග | 626 | 625 | 623 |
| චර්ම රෝග | 529 | 528 | 526 |
| ගෙඩි වන | 360 | 355 | 354 |
| ජලභීතිකා | 180 | 180 | 180 |
| දැවුම් පිළිස්සුම් | 80 | 78 | 77 |
| මානසික | 149 | 144 | 141 |
| විදුම් පිළිස්සුම් | 07 | 07 | 07 |
| වෙනත් | 658 | 658 | 658 |
| එකතුව | 20,713 | 20,353 | 20,004 |

අක්ෂි රෝග , චර්ම රෝග, ගෙඩිවන, දැවුම් පිළිස්සුම් යන පාරම්පරික විශේෂ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී වැඩිවී තිබුණේ පහකට අඩු සංඛ්‍යාවකින් වූ අතර, ජලභීතිකා, විදුම් පිළිස්සුම් සහ වෙනත් යටතේ පාරම්පරික විශේෂ වෛද්‍යවරුන් ලියාපදිංචි වීමක් 2010 වර්ෂයෙන් පසු සිදු වී නොතිබුණි.

5

පසුගිය වසර පහක එක් එක් වර්ෂයේ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම පහත දැක්වේ.

| වෛද්‍යවරුන් | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| උපාධිධාරීන් | 135 | 162 | 161 | 190 | 142 |
| ඩිප්ලෝමාධාරීන් | 95 | 89 | 91 | 72 | 74 |
| පාරම්පරික | 45 | 30 | 75 | 48 | 58 |
| පාරම්පරික විශේෂ | 85 | 68 | 148 | 165 | 129 |
| | 360 | 349 | 475 | 475 | 403 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයට සාපේක්ෂව ඩිප්ලෝමාධාරීන් හැර අනෙක් සියළුම වර්ගයේ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචි වීම 2012 වර්ෂයේ දී අඩු වී තිබුණි.

(ආ) පාරම්පරික විශේෂ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචි වීමේ අඩුවීමක් අනාවරණය වූ අතර එය 2008 වර්ෂයේදී 129 ක් වූ අතර 2011 වර්ෂයේදී 68 ක් දක්වා අඩුවී 2012 වර්ෂයේදී නැවත 85 දක්වා වර්ධනය වී තිබුණි.

(ඇ) උපාධිධාරී වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය 2009 වර්ෂයේදී 190 ක් වූ අතර 2012 වර්ෂය වනවිට එය ක්‍රමයෙන් 135 ක් දක්වා අඩුවී තිබුණි.

### 4.1.2. කමිටු පත්කිරීම

පහත සඳහන් අනු කමිටු 2008 සිට 2012 වර්ෂය දක්වා අඛණ්ඩව පත්කර තිබුණත් එම කමිටු අක්‍රිය වීමෙන් අපේක්ෂිත කාර්යය ඉටු වී නොතිබුණි.

(අ) දේශීය කැඩුම් බිඳුම් වෙදකම පිළිබඳ වෘත්තීය වැඩසටහන

(ආ) දේශීය පාරම්පරික දැනුමට අදාල දත්ත මූලාශ්‍ර පිහිටුවීමේ කමිටුව

(ඇ) අභාවයට යන විදුම් පිළිස්සුම් වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීමේ අනුකමිටුව

(ඈ) පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ විෂය නිර්දේශය සංශෝධනය කිරීම

(ඉ) පශු වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම පිළිබඳ අනු කමිටුව

4.1.4. 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය

2012 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වූ පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි.

(අ) ආයුර්වේද වෛද්‍ය සභාවේ නෛතික රාමුව බලගැන්වීම හා ආයුර්වේද පනතේ නීතිමය නියෝග සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම

(ආ) වෘත්තීමය අධිකාරි බලය පිරිනැමීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

(ඇ) පවත්නා වෘත්තීය සුදුසුකම් පදනම් කරගනිමින් වෛද්‍ය වෘත්තිකයින් ප්‍රභේදකරණය

(ඈ) ආයුර්වේද වෘත්තිකයන්ගේ වෘත්තීය ආචාරධර්ම මාලාව හඳුනා ගැනීම

(ඉ) ආයුර්වේද වෘත්තිකයන්ගේ වෘත්තීය හැසිරීම/ චර්යාව විමර්ෂණය කිරීමේ ක්‍රියාවලියක් ඇති කිරීම

(ඊ) ආයුර්වේද වෛද්‍ය සභාවේ සම්පත් හා පහසුකම් යාවත්කාලීන කිරීම මගින් එහි කාර්යසාධනය වැඩිදියුණු කිරීම

(උ) ආයුර්වේද සංරක්ෂණ සභා වලින් සිදුවන අක්‍රමිකතාවයන් අවම කර සභාව සමඟ සෘජු සම්බන්ධතාවයක් ගොඩනැඟීම සඳහා කටයුතු කිරීම

(ඌ) වෘත්තීය සංවර්ධන වැඩසටහන්

(එ) විශේෂිත වැඩසටහන්

(ඒ) නිලවෙබ් අඩවියට ආයුර්වේද වෛද්‍යවරුන් පිළිබඳ දත්ත ඇතුළත් කිරීම

2012 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචි කළ මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව 20,713 ක් වුවද, වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවියට ඇතුළත් කර තිබූ වෛද්‍යවරුන්ගේ නම් සංඛ්‍යාව 3,000 ක් වී තිබුණි. මෙම වෙබ් අඩවිය 2010 සැප්තැම්බර් 27 දින ආරම්භ කර තිබුණි.

4.2. කාර්ය මණ්ඩල පරිපාලනය

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුර | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | වාර්ෂික වැටුප |
|---|---|---|---|---|
| -------- | ----------------- | ---------------- | --------------- | ------------ |
| | | | | රු. |
| ලේඛකාධිකාරී | 01 | 01 | - | 246,300 |
| ක.සහකාර | 09 | 08 | 01 | 2,778,724 |
| කා.කම්කරු | 02 | 01 | 01 | 237,042 |
| | 12 | 10 | 02 | 3,262,042 |

7

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

(ආ) දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් ආයුර්වේද වෛද්‍ය සභාවේ අභ්‍යන්තර විගණනය සිදු කළයුතු වුවද 2012 වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර 2011 වර්ෂයේදී එක් වතාවකදී පමණක් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් විගණනයක් සිදුකර තිබුණි.

### 5.2 විගණන කමිටු

ආයතනය තුළ විගණන කමිටු පිහිටුවා නොතිබුණු අතර, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන විගණන හා කළමනාකරණ කමිටුව සඳහා වෛද්‍ය සභාව සහභාගී වී තිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය යාවත්කාලීන කිරීම

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

ඒඑම්සි/ඒසිසි/එෆ්ඒ/2012/06 එච්එම්/සී/ඒඑම්සී/එෆ්ඒ/2012 2013.05.23

**විගණකාධිපති,**
**විගණකාධිපති දෙපාර්තමේන්තුව,**
**අංක 306/72,**
**පොල්දුව පාර,**
**බත්තරමුල්ල**

## ආයුර්වේද වෛද්‍ය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දනර මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

උක්ත මැයෙන් මා අමතා එවන ලද ඔබේ අංක එච්එම්/සී/ඒඑම්සී/එෆ්ඒ/2012 හා 2013.05.15 දින දරන විගණකාධිපති වාර්තාව හා බැදේ.

එහි සඳහන් කරුණු පිළිබඳව මාගේ පැහැදිලි කිරීම් පහත පරිදි වාර්තා කරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ). මෙම වැරද නිවැරදි කිරීම සඳහා 2013 වර්ෂයේ දී නිවැරදි ගිණුම් වලට ගැලපීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(ආ). 2012 වර්ෂයට අදාළව 2013 වර්ෂයේ සිදු කර ඇති කාර්යමණ්ඩල වැටුප් ගෙවීම් රු: 16734/-ක් හා දුරකතන ගාස්තු රු.980/-ක් සඳහා අදාළ වෙන්කිරීම් 2012 වර්ෂයේ සිදු නොකිරීම නිසා මෙම ගැටළුව ඇති වී ඇති අතර එය 2013 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු සිදු කර ඇත.

(ඇ). 2013 වර්ෂයේ දී මෙය නිවැරදි කිරීමට අදාළ කටයුතු සිදු කර ඇත.

(ඈ). 2013 වර්ෂයේ දී මෙය නිවැරද කිරීමට අදාළ කටයුතු සිදු කර ඇත.

(ඉ). 2013 වර්ෂයේ දී මෙය නිවැරදි කිරීමට අදාළ කටයුතු සිදු කර ඇත.

(ඊ). අපහරණය කිරීමෙන් ලද ආදායම ආයුර්වේද වෛද්‍ය සභාව වෙත ලැබී ඇත්තේ 2013 වර්ෂයේ ජනවාරි මාසයේ දීය. එම නිසා මෙම නිවැරදි කිරීම සිදු කිරීමට නොහැකි වී ඇති අතර එය 2013 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(උ). ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු සිදු නොකරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

2.2.3 **නොසැසඳුන පාලන ගිණුම**

**ශේෂ පත්‍රයේ සඳහන් ස්ථාවර වත්කම් ගිණුමේ ශුද්ධ අගය 1,567,198/- ලෙස දැක්වීම නිවැර දි වන අතර උප ලේඛනයේ දක්වා ඇති ශේෂය 1,768/-ක් වැඩිපර සඳහන්ව ඇත. එහෙත් නිවැරදි වටිනාකම අවසාන ගිණුම්වලට ගෙන ඇති බැවින් මෙයින් අවසාන ගිණුමේ නිවැරදි භාවයට බලපෑමක් සිදු වී නොමැති බව සඳහන් කරමි.**

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ආයුර්වේද වෛද්‍ය සභාවේ යාවත් කාලීන වෛද්‍ය නාමලේඛනය,රජයේ විගණන අංශයේ කණ්ඩායම් භාර නිලධාරීවරයාගේ උපදෙස් පරිදි අපවෙත ලබා දුන් veeratmdivision@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනයට 2013.03.20 දින යොමු කළ අතර එම තොරතුරු විගණන පරීක්ෂකවරුන් වෙත ද ලබා දුන් බැවින් මෙම කරුණු දැක්වීම පිළිගත නොහැකි බව සඳහන් කරමි.

2.2.5 නීතිරීති,රෙගුලාසි හ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

(අ). ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතුරින් තොරාපත් කර ගනු ලැබූ සමාජිකයින් තුන් දෙනකු පත් කිරීම සම්බන්ධයෙන 1963 15 දිනැති 13567 දිනැති ගැසට් පත්‍රය නිකුත් කර ඇත. එහි මෙම පත් කිරීම සඳහා සිදු කළ යුතු ජන්ද විමසීම සම්බන්ධව පූර්ණ වගකීම සහිත බලධාරියා වන්නේ ආයුර්වේද කොමසාරිස්වරයාය.

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේකකාධිකාරි විසින්, මෙම තෝරා පත් කර ගැනීම සඳහා ආයුර්වේද වෛද්‍යවරන්ගේ නාම ලේඛනය කොමසාරිස් වෙත ලබා දිය යුතුය.1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 11(1)ඉ වගන්තිය යටතේ පත් කර ගත යුතු මෙම වෛද්‍යවරුන් තිදෙනා දැනට ලියාපදිංචි වෛද්‍යවරුන් 20000කට අධික සංඛ්‍යාව අතුරින් ජන්දයෙන් පත් කර ගත යුතුය. මේ සඳහා මූලික පියවර වශයෙන් ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ නාම ලේඛනය යාවත් කාලීන කිරීමේ කටයුතු සඳහා දිවයිනේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත තොරතුරු යොමු කර දැනට ඉන් ප්‍රතිචාර ලැබෙමින් පවතී.මේ සම්බන්ධව පුවත්පත් දැන්වීම් පළකිරීම මගින් ලියාපදිංචි වෛද්‍යවරුන් දැනුම්වත් කර ඇත.

(ආ). 2005 ජුලි 15 දින ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාඅංක 14/13/8(3) අනුව ගන්නා ලද, ලියාපදිංචි ගාස්තුවෙන් 1/4ක ගාස්තුවෙන් අයකර වසර 05කට වරක් සියළු වෛද්‍යවරුන් ලියපදිංචිය අළුත් කළයුතු බවට ගත් තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය අවහිරතා පැවතීම හේතුවෙන් මෙතෙක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට නොහැකි වී ඇත. දැනට ආචාරධර්ම පිළිබඳ සංශෝධන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. සංශෝධිත ආචාරධර්ම අනුමත වූ පසු ඉදිරි කටයුතු සිදු කිරීමට 2012.04.03 වෛද්‍ය සභාව තීරණය කරන ලදී.

3.1 කාර්ය සාධනය

3.1.1 වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

(ආ). සටහන් කර ගන්නා ලදි.

(ආ). සටහන් කර ගන්නා ලදි.

(ඇ). ( i). සටහන් කර ගන්නා ලදි.

(ii). පාරම්පරික වෛද්‍යවරුන් සම්මුඛ පරීක්ෂණ හා ලිඛිත පරීක්ෂණ වලින් සමත් වීමේ ප්‍රතිශතය අනුව හා ආයුර්වේද වෛද්‍ය සභාව විසින් වරින් වර ගනු ලබන තීරණ මත වාර්ෂිකව ලියාපදිංචි පාරම්පරික වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව වෙනස් වීමට භාජනය වන බව සඳහන් කරමි.

(ii).විශ්ව විද්‍යාල වලින් පිටවෙන වෛද්‍යවරුන් සංඛ්‍යාව අනුව එම වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වනු ලබන උපාධිධාරි වෛද්‍යවරුන් සංඛ්‍යාව වාර්ෂිකව වෙනස් වන බව සඳහන් කරමි.

(iv). ආයුර්වේද ශාස්ත්‍ර හා යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත් වෛද්‍යවරුන් සංඛ්‍යාව අනුව ඩිප්ලෝමාධාරි වෛද්‍යවරුන්ගේ ලියාපදිංචි වන සංඛ්‍යාව වෙනස් වනු ඇත.

3.1.2 කමිටු පත් කිරීම

i දේශීය කැඩුම් බිඳුම් වෙදකම පිළිබඳ වෘතීතිය සංවර්ධන වැඩ සටහන

වෛද්‍ය සභාවේ ඉල්ලීම අනුව, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය වෙත අප විසින් රැස්කල තොරතුරු ලබා දී ඇති අතර එම ආයතනය මගින් කැඩුම් බිඳුම් වෛද්‍යවරුනගේ දැනුම සංරක්ෂණය කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

ii දේශිය පාරම්පරික දැනුමට අදාළ දත්ත මුලාශ්‍රය පිහිටුවීමේ කමිටුව

දේශීය පාරම්පරික වෛද්‍යවරුන් සම්බන්ධ එක් රැස් කර ඇති දත්ත පරිගණක ගත කර ඇති අතර එම තොරතුරු අවශ්‍යතාවය අනුව අදාළ බාහිර ආයතන හා පුද්ගලයින් වෙත නිකුත් කිරීමට කටයුතු සිදු කොට ඇත.

ii අභාවයට යන විදුම් පිලිස්සුම් වෛද්‍ය ක්‍රම සංරක්ෂණය කිරීමේ අනු කමිටුව

2010 වර්ෂයේ සිට මෙම කමිටුව ක්‍රියාත්මක නොවේ.2013 වර්ෂයේ මෙය නැවත සක්‍රිය කොට ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

iv පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ විෂය නිර්දේශය සංශෝධනය කිරීමේ අනු කමිටුව

මේ යටතේ විෂය විෂයයන් 08ක් සංශෝධනය කළ යුතුව ඇති අතර දැනට විෂයයන් 05ක සංශෝධනය සිදුකර අවසන් කර ඇත.2010 වර්ෂයේ සිට මෙම කමිටුව ක්‍රියාත්මක නොවේ.ඉදිරි සංශෝධන කටයුතු සඳු කිරීමට කටයුතු කරනු ලැබේ.

v. පශු වෛද්‍යක්‍රමය සංරක්ෂණය කිරීම පිළිබඳ අනු කමිටුව

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පශු වෛද්‍යවරුන් පිලිබඳ තොරතුරු රැස් කර ඇති අතර පවතින නීතිමය පසුබිම අනුව මෙම අංශය ලියාපදිංචි කිරීම සම්බන්ධව දැනට කටයුතු සිදු කරනු නොලැබේ.මේ පිළබඳ නීතිමය තත්වය 2011.03.18 දිනැති ඊ/35/2011 සමාංකයෙන් යුතු ලිපියෙන් නීතිපති විසින් අප වෙත දැනුම් දී ඇත. ඒ අනුව දේශිය පශු වෙදකම ලියාපදිංචි කිරීම සඳහා කිසිදු ප්‍රතිපාදනයක් ආයුර්වේද වෛද්‍ය සභාව වෙත නොමැති බව දැනුම් දී ඇත. එහෙත් මේ පිලිබඳ සම්පත් දායකයින් හා සාකච්ජා සිදු කරමින් තොරතුරු රැස්කිරීමට කටයුතු කරනු ලැබේ.

### 3.1.3 2012 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්ම හා ප්‍රගතිය

1. ආයුර්වේද වෛද්‍ය සභාවේ නෛතික රාමුව බල ගැන්වීම හා ආයුර්වේද පනතේ නීතිමය නියෝග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

(i) . මේ සඳහා මුලික පියවර වශයෙන් ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ නාම ලේඛනය යාවත් කාලීන කිරීමේ කටයුතු සඳහා දිවයිනේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත තොරතුරු යොමු කර දැනට ඉන් ප්‍රතිචාර ලැබෙමින් පවතී.මේ සම්බන්ධව පුවත්පත් දැන්වීම් පළකිරීම මගින් ලියාපදිංචි වෛද්‍යවරුන් දැනම්වත් කර ඇත.

(ii). ආයුර්වේද වෛද්‍ය සභාවේ අනුමැතිය පරිදි අවශ්‍ය අවස්ථාවල දි දේශිය වෛද්‍ය අමාත්‍යාංශයෙන්, නීතිපති දෙපාර්තමේන්තුවෙන්, පොලිස් දෙපාර්තමේන්තුවෙන් හා දෙපාර්තමේන්තු නීති සහකාර වරයාගේ උපදෙස් ද ලබා ගනී.

(iii). ආයුර්වේද වෛද්‍ය සභාවට අයත් කාර්යයන් පිළිබඳ දැනට පසුවිපරම් සහිතව කටයුතු කරනු ලැබේ.

(iv). සභාව විසින් දැනට භාවිතා කරනු ලබන සභාවේ ලාංජනය ලියාපදිංචි කිරීම සඳහා යොමු කළ අතර එහි පවතින ඇතැම් ලාංජන කොටස් ඉවත් කළ යුතු බව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මගින් දැනුම් දී ඇත. එහෙත් දැනට භාවිතා කරන ලාංජනය ඉවත් කිරීමට වෛද්‍යවරුන් අකමැති වීම නිසා මෙය සිදු කිරීමට නොහැකි වී ඇත.

2.වෘත්තිමය අදිකාර බලය පිරිනැමීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම.

(0). වෛද්‍යවරුන් සඳහා විශේෂඥතාවය නිර්ණය කිරීම සහ ඒ සඳහා ආයතනයක් පිහිටුවීම යන පවතිපත්තිමය කරුණු දේශිය වෛද්‍ය අමාත්‍යාංශය / උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ අදාළ විශ්ව විද්‍යාල ආයතන වල මැහපෙන්වීම මත සිදුවිය යුතු අතර වෛද්‍ය සභාවට මේ සඳහා සෘජුව මැදිහත්වීමේ හැකියාවක් නොමැති බව දන්වමි.

(i). වෛද්‍යවරුන් සඳහා විශේෂඥතාවය නිර්ණය කිරීම සහ ඒ සඳහා ආයතනයක් පිහිටුවීම යන ප්‍රතිපත්තියමය කරුණු දේශීය වෛද්‍ය අමාත්‍යාංශය/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ අදාළ විශ්ව විද්‍යාල ආයතන වල මහපෙන්වීම මත සිදුවිය යුතු අතර වෛද්‍ය සභාවට මේ සඳහා සෘජුව මැදිහත්වීමේ හැකියාවක් නොමැති බව දන්වමි.මේ සම්බන්ධව විශ්වවිද්‍යාලවල අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇති අතර අදාළ කාරණය ආරම්භ වූ පසු ලියාපදිංචි කිරීමේ කටයුතු ආයුර්වේද වෛද්‍ය සභාව මගින් සිදු කළ හැකි බව දන්වමි.

(ii). පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය යාවත් කාලීන කිරීම හා සමාලෝචනය සිදු කර ඇති අතර ඒ ඒ අවස්ථාවන් වලදී පැන නගිනු ලබන ගැටළු අනුව අදාළසමාලෝචන කටයුතු වරින් වර සිදු කරනු ලැබේ.

3.පවත්නා වෘත්තිය සුදුසුකම් පදනම් කර ගනිමින් වෛද්‍ය වෘත්තිකයන් ප්‍රභේදකරණය

(i). ආයුර්වේද පනතේ විධිවිධාන නොමැති බැවින් පනත සංශෝධනය කිරීම සඳහා යොමු කර ඇත.

(ii). පනත සංශෝධනය කිරීම සඳහා යොමු කර ඇත.

(iii). පනත සංශෝධනය කිරීම සඳහා යොමු කර ඇත.

(iv). මේ සම්බන්ධව දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය, ආයුර්වේද පර්යේෂණ ආයතනය, ආයුර්වේද ශික්ෂණ රෝහල හා විශ්ව විද්‍යාල සමග මේ පිළිබඳව කටයුතු කරමින් පවතී.

4. පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා විධිමත් පුහුණුවක් ලබාදීමට කටයුතු කිරීම

(i).ආයුර්වේද ක්ෂේත්‍රයට අදාළව පුහුණු වැඩ සටහන් සඳහ පිහිටුවා ඇති එකම ආයතනය දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජතික ආයතනය වේ.2012 වර්ෂය ආරම්භයේ සිට ලියාපදිංචිය ලබා ගන්නා සියළු වෛද්‍යවරුන් හට දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය සමග එක්ව මෙම කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. ඕ අනුව 2012 වර්ෂයේ නවක ලියාපදිංචි වෛද්‍යවරුන් 276 දෙනකු සඳහා පුහුණු ලබා දී ඇත.

5.ආයුර්වේද වෘත්තිකයන්ගේ වෘත්තිය අචාරධර්ම මාලාව හඳුනා ගැනීම

**පවතින වෘත්තිය ආචාරධර්ම මාලාව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කරන අතර දැනට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති ආචාරධර්ම අනුමත වූ පසු ඉදිරි කටයුතු සිදු කිරීමට 2012.04.03 වෛද්‍ය සභාව තීරණය කරන ලදී.**

6. ආයුර්වේද වෘත්තිකයන්ගේ වෘත්තිය හැසිරීම/චර්යාව විමර්ෂණය කිරීමේ ක්‍රියාවලියක් ඇති කිරීම

**පවතින වෘත්තිය ආචාරධර්ම මාලාව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.**

7.ආයුර්වේද වෛද්‍ය සභාවේ සම්පත් හා පහසුකම් යාවත් කාලීන කිරීම මගින් එහි කාර්ය සාධනය වැඩි දියුණු කිරීම.

ආයුර්වේද වෛද්‍ය සභාව සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් වෙනම ගොඩනැගිල්ලක මහල් දෙකක් දැනට ලබා දී ඇත අතර එමගින් ආයුර්වේද වෛද්‍ය සභාවේ ස්වාධීනත්වය හා ප්‍රතිරූපය ආරක්ෂාවන පරිදි කටයුතු කිරීමට හැකියාවක් ලැබී ඇති බව සඳහන් කරමි.

ආයුර්වේද වෛද්‍ය සභාව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ප්‍රතිපාදන ඉදිරි වර්ෂ වලදී වෙන් කර ගැනීමට ඇති හැකියාව පිළිබඳ මහා භාණ්ඩාගාරය සමග ඉදිරියේ දී සාකච්ඡා කිරීමට කටයුතු කරනු ලැබේ.එතෙක් ඊට සුදුසු ඉඩමක් වෙන් කර ගැනීම සඳහා ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වෙත ලිඛිත ඉල්ලීමක් සිදු කර ඇති අතර ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා ද දැනුම්වත් කර ඇති බව සඳහන් කරමි.

8.ආයුර්වේද සංරක්ෂණ සභා වලින් සිදුවන අක්‍රමිකතාවයන් අවම කර සභාව සමග සෘජු සම්බන්ධතාවයක් ගොඩනැගීම සඳහා කටයුතු කිරීම.

(i)(ii). වර්තමානයේ ආයුර්වේද සංරක්ෂණ සභා ක්‍රියාත්මක කරනු ලබන්නේ පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් යටතේ ය. ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පැවති සංරක්ෂණ සභා ව්‍යවස්ථාව සංශෝධනය කර සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත එහි පිටපත් යොමු කර ඇති බව සඳහන් කරමි.ඒ අනුව මෙම සංරක්ෂණ සභා වල ඉදිරි ක්‍රියාකාරීත්වය පිළිබඳව පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් සමඟ සම්බන්ධතා පවත්වා ගනිමින් සොයා බැලීමට කටයුතු කරනු ලැබේ.

9.ආයුර්වේද වෛද්‍ය සභාව මගින් කුත් කරනු ලබන අයදුම්පත් වෙබ්අඩවිය හරහා ලබා ගැනීමට කටයුතු සැලැස්වීම.
(i).(ii).(iii). ආයුර්වේද වෛද්‍ය සභාව මගින් නිකුත් කරනු ලබන සියළු අයැදුම්පත් වෙබ් අඩවියට ඇතුළත් කර ඇත.ලියාපදිංචිය සඳහා නිකුත් කරනු ලබන අයැදුම්පත් වෙබ් අඩවිය හරහා ලබා ගැනීමේ දී ගෙවිය යුතු ගාස්තුව හා අයැදුම්පත් අනු අංකය සම්බන්ධව ගැටළුවක් මතුව පැවතියත් ඒ සඳහා මේ වන විට සුදුසු විසඳුම අනුගමනය කරමින් කටයුතු කරගෙන යනු ලැබේ.

10.වෘත්තිය සංවර්ධන වැඩසටහන්

(i).(ii).(iii). 2012 වර්ෂයේ දී මෙම වැඩ සටහන් ක්‍රියාත්මක නොවූ අතර මේ පිළිබඳ ආයුර්වේද වෛද්‍ය සභාව දැනුම්වත් කර 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

11. විශේෂිත වැඩ සටහන්

(i). 2012 වර්ෂයේ ක්‍රියාත්මක නොවීය

(ii). 2012වර්ෂයේ ක්‍රියාත්මක නොවීය.2013 වර්ෂයේ දැයට කිරුළ වැඩ සටහනට සමගාමීව අම්පාර ආයුර්වේද රෝහලේ දී 2013.03.24 දින ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

12. නිල වෙබ් අඩවිය

දැනට ලියාපදිංචි වෛද්‍යවරුන් සියළු දෙනාගේ තොරතුරු ඉංග්‍රීසියට පරිවර්තනය කර ඇති අතර සියළුම නාමලේඛනය වෙබ් අඩවියට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

3.2 කාර්ය මණ්ඩල පරිපාලනය

සටහන් කර ගන්නා ලදී.ආයුර්වේද වෛද්‍ය සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 12 කි.2013.05.20 දින වන විට සිටින තත්‍ය සේවක සංඛ්‍යාව 11 දෙනකු බව සඳහන් කරමි.

4. පද්ධති හා පාලන

(අ). ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ ලියාපදිංචි යාවත් කාලින කිරීම

(i).(ii).තොරතුරු යාවත් කාලින කිරීම සඳහාසියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අදාළ වෛද්‍යවරුන්ගේ තොරතුරු යොමු කරමින් යාවත් කාලින කිරීමේ කටයුතු සිදු කරන ලදී.එසේම ආයුර්වේද ලිත යොමු කිරීමේ දී වෛද්‍යවරුන් වෙත යාවත් කාලීන ආකෘති පත්‍ර යොමු කරමින් ද මෙම කටයුත්ත සාර්ථක කර ගැනීමට කටයුතු කරන ලදී.

මෙවැනි වංචාකාර කටයුතු සිදු වන බවට වෛද්‍ය සභාවට ද තොරතුරු ලැබී ඇති අතර දැනට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති ආචාරධර්ම අනුමත වූ පසු මෙවැනි වංචනික ක්‍රියා පිළිබඳව පවතින නීතිරීති යටතේ කටයුතු කරනු ලැබේ.

ඇතැම් පළාත්වල දක්ෂ පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි නොවී පාරම්පරික වෛද්‍ය වෘත්තියේ යෙදෙන බව සඳහන් කරන අතර ඔවුන් මෙම ලියාපදිංචිය ලබා ගැනීම සඳහා කොතෙක් උනන්දු කළ ද එය ලබා ගැනීමට උන්නදුවක් නොමැති බව වැඩි දුරටත් දන්වා සිටිමි.

(iii).ලියාපදිංචි වෛද්‍යවරුන් මියගිය පසු ඒ බව ආයුර්වේද වෛද්‍ය සභාව වෙත දැනුම් දීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සියළුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත 05/2006 හා 2006.08.03 දිනැතිව දෙපාර්තමේන්තු චක්‍රලේඛයක් නිකුත් කර ඇති අතර එමගින් අදාල තොරතුරු ලැබෙමින් පවතී.ඒ සම්බන්ධව 2011.04.26 දිනැතිව නැවත සිහිකැඳවීමක් ද රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කර ඇති බව වැඩි දුරටත් සඳහන් කරමි.

(iv). ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තුව දැනටමත් අනුමත කර ඇති අතර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති ආචාරධර්ම අනුමත වූ පසු  මෙය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

(v). ගංජා, අබින් වැනි ද්‍රව්‍ය නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මාර්ගයෙනි.ඔවුන් එම ඉල්ලීම් කරනු ලබන වෛද්‍යවරුන්ගේ නාම ලේඛනය පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මගින් සනාථ කර ගැනීමට යොමු කරනු ලබන අතර එම නාමලේඛන ඇතැම් පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් විසින් ආයුර්වේද වෛද්‍ය සභාව වෙත යොමු කර ලියාපදිංචිය සනාථ කර ගනු ලබන බව සඳහන් කරමි.

(ආ).අභ්‍යන්තර විගණනය

ආයුර්වේද වෛද්‍ය සභාව ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් අභ්‍යන්තර විගණනය සිදු නොකරන අතර දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටුව සඳහාආයුර්වේද රෛද්‍ය සභාව සහභාගී කර ගනු ලැබේ.

(ඇ). ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ සොයාබැලීමේ කටයුතු

දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව වෙත යොමුකර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(ඇ). වෘත්තීය සංවර්ධන වැඩසටහන්

2012 වර්ෂයේ මෙය එළිදැක්වීමට නොහැකි වූ අතර දැනට භාෂා පරිවර්තන දෙපාර්තමේන්තුවෙන් පරිවර්තනය කර ලැබුණු කෙටුම්පත් උපයෝගී කර ගනිමින් 2013 වර්ෂයේ දී මෙම පොත එළිදැක්වීමට කටයුතු කරනු ලැබේ.

**අ/කලේ.පී.එස්.කේ.ආර්.වීරකෝන්**
**ආයුර්වේද කොමසාරිස් සහ**
**ආයුර්වේද වෛද්‍ය  සභාවේ සභාපති.**

පිටපත්

1. ලේකම්,මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
2. ලේකම්,දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# සංස්ථාපිත තොරතුරු

නම -

ආයුර්වේද වෛද්‍ය සභාව

ව්‍යවස්ථාපිත තත්වය -

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශය අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. 1935 අංක 46 දරන ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා ලනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරන ස්වදේශීය වෛද්‍ය ආඥා පනතේ ( 1945 අංක 49 හා 1949 අංක 49 මඟන් සංශෝධිත ) විධිවිධාන යටතේ යළිත් ස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

බැංකුකරුවෝ -

1. ලංකා බැංකුව, ( ප්‍රධාන බැංකුකරු )
   මහරගම

2. ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
   ඉතුරුම් නිවස,
   ප්‍රධාන කාර්යාලය,
   කොල්ලුපිටිය.

විගණකයින් -

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නො.306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.


| | | |
|---|---|---|
| සභාපති<br>êéùôè°  011-2847555<br>2896911- 1<br>Chairman | ලේඛකාධිකාරී  011-5672906<br>çêðôèóè°  011-2746754<br>Registrar | කාර්යාලය  011 -5672905<br>æèèðáèùáë°  011 -<br>Office  Ext. 315/316/321 |

Web site :- www.ayurvedicmedicoun.gov.lk  E mail :- ayurmc@sltnet.lk

# ස්තූතිය

ගරු දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

දේශීය වෛද්‍ය ලේකම්තුමා

ආයුර්වේද වෛද්‍ය සභාවේ සියළුම සාමාජික භවතුන්

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ආයුර්වේද දෙපාර්තමේන්තුව

දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය

පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

සියළුම පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන්

විගණකාධිපති දෙපාර්තමේන්තුව

නීතිපති දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

සියළුම ජනමාධ්‍ය ආයතන

සියළුම දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල

සියළුම ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සභා

හා

**ආයුර්වේද වෛද්‍ය සභා කාර්ය මණ්ඩලය**

